# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2162/32 - 2020 පෙබරවාරි මස 13 වැනි බ්‍රහස්පතින්දා - 2020.02.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (XVI)(A)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලද නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

කොළඹ දී ය.

නියමාවලිය

1. මෙම නියමාවලිය 2020 අංක 02 දරන පුරා විද්‍යා පශ්චාත් උපාධි ආයතන (සංශෝධන) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

2. 1996 පෙබරවාරි මස 09 වැනි දින අංක 909/13 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නියමාවලිය මඟින් අවසන් වරට සංශෝධිත පරිදි වූ, 1985 දෙසැම්බර් මස 31 වැනි දින අංක 382/6 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ 1985 අංක 2 දරන පුරා විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය එහි 6 වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"6. (මෙහි මින් මතු "මණ්ඩලය " යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලය ආයතනයේ අධ්‍යයන සහ විධායක මණ්ඩලය විය යුතු අතර, එය -



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(අ) පහත දැක්වෙන නිලබලයෙන් පත් වූ සාමාජිකයන්, එනම් -

(i) අධ්‍යක්ෂවරයා ;

(ii) උසස් අධ්‍යාපන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයෙකු ;

(iii) මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයෙකු ;

(iv) පුරා විද්‍යා අධ්‍යක්ෂ-ජනරාල්වරයා හෝ ඔහුගේ නාමිකයෙකු ;

(v) කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපතිවරයා ; සහ

(vi) කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨයේ පීඨාධිපතිවරයා ;සහ

(ආ) (මෙහි මින්මතු ''පත්කළ සාමාජිකයන් '' යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යාපන, වෘත්තීමය, විද්‍යාත්මක හෝ පරිපාලන විෂය ක්ෂේත්‍රයන්හි විශිෂ්ට සේවාවක් ඉටු කර ඇති තැනැත්තන් අතරින් කොමිෂම විසින් පත්කරන ලද සාමාජිකයන් හත් දෙනෙකුගෙන්.

සමන්විත වන්නේ ය. ''.

02 - 578

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.